2024 - 09

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2024

## සිංහල භාෂාව හා සාහිත්‍යය-1

නම/ විභාග අංකය - ..............................................

| 11 ශ්‍රේණිය | 1 පත්‍රය | කාලය පැය එක යි. |
|---|---|---|

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) හා (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

● අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි <u>තද කළු</u> අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. බඩු මිල ඉහළ යාමත් සමග තම <u>**මඩිය තර කර ගැනීමට**</u> බොහෝ වෙළෙන්දෝ උත්සාහ ගනිති.

   (1) භාණ්ඩ වැඩියෙන් විකුණා ගැනීමට (2) ව්‍යාපාර සඳහා වැඩිපුර මුදල් යෙදවීමට

   (3) අනිසි ලෙස වැඩියෙන් ලාභ ලැබීමට (4) තම ගබඩා සම්පූර්ණයෙන් ම පුරවා ගැනීමට

2. ගමනාගමන හා ප්‍රවාහන සේවයේ පවතින අඩු පාඩු පිළිබඳ මහජනයා අදාළ බලධාරීන්ට කරන පැමිණිලි, <u>**බීරි අලින්ට වීණා වාදනය කිරීමකි.**</u>

   (1) සාධාරණ වැඩකි. (2) නිෂ්ඵල වැඩකි.

   (3) යහපත් වැඩකි. (4) සතුටු වැඩකි.

3. බන්ධනාගාර නිලධාරීන්ගෙන් මිදුණ සිරකරු <u>**අසුර ගසන සැණින්**</u> උසාවි බිමෙන් පිට විය.

   (1) ඉතා සතුටින් (2) දැඩි බියෙන් (3) අත්පුඩි ගසමින් (4) ඉතා ඉක්මනින්

● අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. ගෞරවනීය නිර්මාණ ශිල්පියා වෙනුවෙන් පාසල් සිසුහු ...................... ගී ගායනා කළහ.

   (1) අභිවන්දන (2) අභිරූපණ (3) අභිනන්දන (4) අභිප්‍රේරණ

5. ලබන සතියේ කාලගුණ තත්ත්වය පිළිබඳ කාලගුණ විද්‍යාඥයා .................................. යෙදෙයි.

   (1) විමර්ශනයක (2) පුරෝකථනයක (3) සමාලෝචනයක (4) සමීක්ෂණයක

6. රටක සවිමත් හා නීරෝගී බව්න් ......................... පරපුරක් බිහි කිරීම උදෙසා අවශ්‍ය පදනම සකසා ගත යුතු ය.

   (1) අනූන (2)අනන්‍ය (3) අනුපාත (4) අනුමාන

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

   (1) ප්‍රතිඵල , වළාකුළ , ප්‍රණාමය , විදර්ශන (2) විශිෂ්ඨ , පිළිගැනීම , දර්ශනය , පුස්ථකාලය

   (3) ලේඛනය , සමස්ත , ගවේෂණය , කසළ (4) කෑතිම , ශිෂ්ටාචාරය , නිර්මාණ , කනිෂ්ය

Learning Resource Center
De Mazenod College
Kandana

8. ප්‍රත්‍යක්ෂ, මුහුද, ගෞරව, පිහිය යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කෙටි පාපිල්ල, රකාරාංශය, කොම්බුව හා ගැට පිල්ල, කෙටි ඉස්පිල්ල

(2) කෙටි පාපිල්ල, ඉස්පිල්ල, කොම්බුව හා ගයනුකිත්ත, කෙටි ඉස්පිල්ල

(3) රකාරාංශය, කෙටි පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත, කෙටි ඉස්පිල්ල

(4) රකාරාංශය, කෙටි පාපිල්ල, ගයනුකිත්ත, ඉස්පිල්ල

9. ' අධිකාරී ' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,

(1) දන්තජ, ඕෂ්ඨජ හා මූර්ධජ ය  (2) දන්තජ, කණ්ඨජ හා මූර්ධජ ය

(3) කණ්ඨජ, දන්තජ හා ඕෂ්ඨජ ය  (4) ඕෂ්ඨජ , තාලුජ හා දන්තජ ය

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) අනුලා දේවි , සෝමා දේවි ,විහාරමහා දේවි , ලීලාවතී රජින

(2) හිඳගල , සීගිරිය , සිතුල් පව්ව , මිහින්තලේ

(3) සරච්චන්ද්‍ර , වික්‍රමසිංහ ,සේනානායක , සේකර

(4) කාව්‍යශේඛරය , කුස ජාතකය , ගුත්තිලය , බුදුගුණ අලංකාරය

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය වන්නේ,

(1) උගතුන් , ධනවතකු , නිළියක , සතුරන්  (2) ළමයා , හෙදියක් , මුවන් , දෙවියන්

(3) නරියෙකු , සිංහයෙකු , කාන්තාවක් , මිනිසෙක්  (4) මිනිස්සු , ගවයෝ , ගිරවු , සිසුහු

12. "තිවා............පියවා ගෙන  දැස<br>
නිදා ඉන්න.............කළුවර  රැක<br>
පිපී මලක් වී.............සුදු  රෝස<br>
මෙසේ ඇයි නගනු.............  මදහාස "

මෙම කවියේ හිස්තැන් සඳහා සුදුසු පද පිළිවෙළින් ඇති වරණය වන්නේ,

(1) නගරේ , තාරකා , අම්මේ , ගේ ළඟ  (2) තාරකා , නගරේ , ගේ ළඟ , අම්මේ

(3) නගරේ , අම්මේ , ගේ ළඟ , තාරකා  (4) අම්මේ , නගරේ , ගේ ළඟ , තාරකා

13. පහත දී ඇති වාක්‍යවල ඉරි ඇඳි පදවල විභක්ති පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(i) ගුරුතුමා <u>සිසුවාට</u> සහතිකයක් පිරිනමයි

(ii) වෛද්‍යමහතා විසින් <u>රෝගීහු</u> සුවපත් කරනු ලබති.

(iii) වෙළෙන්දෝ <u>පාරෙහි</u> වෙළෙඳාම් කරති.

(iv) ලේනා <u>ගසින්</u> වැටෙයි.

(1) සම්ප්‍රදාන , ප්‍රථමා , ආධාර , අවධි

(3) කර්ම , අවධි , සම්ප්‍රදාන , ප්‍රථමා

(2) සම්ප්‍රදාන , කර්ම , ආධාර , අවධි

(4) කර්ම , ප්‍රථමා , අධාර , කරණ

14. දී ඇති පද්‍ය පාඨයෙහි ඉරි ඇඳි පදවල ව්‍යාකරණ නිවැරදි ව පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

" කඳුළු හෙළා <u>නැඹිලියට</u> සහල් <u>ගරන</u> අම්මා<br>
<u>සුසුම්</u> හෙළා <u>ගිනිදලු</u> ගෙන ලිප මොළවන අම්මා "

(1) විභක්ති , ක්‍රියා , විශේෂණ , කෘදන්ත  (2) නාම , ක්‍රියා , විශේෂණ , කෘදන්ත

(3) විභක්ති , කෘදන්ත , සමාස , ක්‍රියා  (4) නාම , ක්‍රියා , සමාස , කෘදන්ත

2024.09

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය වන්නේ,

(1) ක්‍රියා - කටමින් , කියන , කරව , ගයා

(2) තද්ධිත - ඉසුරුමත් , සිල්වත් ,නැණවතා, ප්‍රාථමික

(3) යුගල පද - සද්දබද්ද , උඩයට , වංහුං , අතනමෙතන

(4) උපමා - සඳ සේ , මල් මෙන් , පිනි මුතු , ගඟ වැනි

16. ධන + ඊශ්වර , පර + උපකාර , අඹ + පාර , පූජා + උත්සව , යන පද නිවැරදි ලෙස සන්ධි වන්නේ

(1) ධනේශ්වර , පරූපකාර , අම්පාර , පූජෝත්සව

(2) ධනීශ්වර , පරූපකාර , අඹපාර , පූජෝත්සව

(3) ධනීශ්වර , පරෝපකාර , අම්පාර , පූජෝත්සව

(4) ධනේශ්වර , පරෝපකාර , අම්පාර , පූජෝත්සව

17. "පුර සඳ
පම සඳ
හිමි සඳ
සිරි සඳ"

මෙහි 'සඳ' යන පදයේ අදහස පිළිවෙළින් නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) චන්ද්‍රයා . කල්හි . කාන්තාව . උතුම්

(2) චන්ද්‍රයා , කල්හි , උතුම් , කාන්තාව

(3) කල්හි , චන්ද්‍රයා , උතුම් , ශ්‍රියා කාන්තාව

(4) උතුම් , කාන්තාව , චන්ද්‍රයා , කල්හි

- ඉරි ඇඳි කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

18. කඳුකර මාර්ගවල නාය යෑම් <u>අනවරතයෙන්</u> සිදු වන්නකි.

(1) වරින්වර (2) අනිවාර්යයෙන් (3) නිරන්තරයෙන් (4) අනතුරු සහිතව

19. කවියෙහි හිස්තැන් සඳහා යෙදිය යුතු වචන අනුපිළිවෙළ තෝරන්න.

සපුනා............... අඹ දඹ තුරු පෙළ දිලෙනා
බිඟුනා.............. යුත් මන සවන පිනවනා
ගිමනා..............ගත සුවඇති නල හමනා
නතනා..................කෙවනා සොබන ඒ උයනා

(1) වීනා . උනා , දිනා , පනා (2) වීනා , පනා , උනා , දිනා

(3) පනා , දිනා , උනා , වීනා (4) දිනා , වීනා , පනා , උනා

20. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් සමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1) | පාද-බාහු , නාදය-හඬ , කන-කර්ණය , පක්ෂියා-විහඟ |
| 2) | ගඟ-නදිය , සකිය-මිතුරා , බල්ලා-සුනඛයා , දත්-දසන් |
| 3) | හඳ - සොමි , ගල - ශෛල , සූළඟ - ලවන් , තරුණ - යොවුන් |
| 4) | කාන්තාව - ස්ත්‍රිය , නරියා - හිවලා , පුෂ්පය - රෝස , ගස් - ශාක |

21. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයක් සමඟ බැඳි <u>නො පවත්නා</u> පද පේළිය තෝරන්න.

(1) හට්ටිය , මුට්ටිය , කොරහා , නැඹිලිය

(2) පොත , පෑන , පැන්සල , මකනය

(3) පොරව , පිහිය , පුටුව , මන්නය

(4) වැලි , සිමෙන්ති , ගඩොල් , කළුගල්

Learning Resource Centre
De Mazenod College
Kandana

22. ප්‍රතිවිරුද්ධාර්ථ දනවන පද දෙකක් යෙදී නොමැති පද පේළිය වන්නේ,

(1) අනුමාන සාක්ෂි මත නොව ප්‍රත්‍යක්ෂ සාක්ෂි මත තීරණය ප්‍රකාශ කෙරිණි.

(2) අපගේ සාමාන්‍ය දෛනික කටයුතුවල දී වුව ද කාලය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

(3) විවිධ අවස්ථාවල දී සරල හා සංකීර්ණ ගැටලු මතු වෙයි.

(4) ඔහු කීර්තිමත් ලේඛකයෙකු බව නැවත වරක් ප්‍රත්‍යක්ෂ විය.

23. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) " අවමාන" යන වචනයෙහි "අව" යනු උපසර්ගය යි.

(2) සඤ්ඤක අක්ෂර, අර්ධ අනුනාසික යන නාමයෙන් ද හැඳින්වේ.

(3) ඌෂ්මාක්ෂර, ඝෝෂාක්ෂර නමින් ද හැඳින්වේ.

(4) " ඕතොමෝ " ගෞරවාර්ථ බහු වචන පදයක් නොවේ.

24. පහත දී ඇති වචනවල අර්ථ නිවැරදි ව දක්වා ඇති පිළිතුර වන්නේ,

A - උදුල E - ඇතිරූ
B - ළඟ F - අසල
C - ලකළ G - අලංකාර
D - අතුළ H - බබළන

(1) AH,BF,CG,DE (2) AE,BF,CG,DH (3) BE,CF,DG,AH (2) AH,BF,CE,DG

25. " එළිපත්ත උඩ ඉන්න බළලා වගේ " යන්නට වඩාත් උචිත අර්ථය වන්නේ,

(1) සුදුසු රැකවරණයක් නැති බව (2) අනවබෝධයෙන් යමක් කිරීම

(3) අවදානමක් ඇතිව කටයුතු කිරීම (4) ස්ථිර තීරණයක් ගත නො හැකි බව

26. පහත සඳහන් අක්ෂර ගැළපීමෙන් නිවැරදි ව සැකසෙන ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය වන්නේ,

(1) යුතගායන් (2) ගයරාවික (3) පෙගරළිනම් (4) යුගකලය

27. 'අන්දැකීම' හා 'වස්තුබීජය' යන්නට පර්යාය පද වශයෙන් සඳහන් වන්නේ,

(1) අනුභූතිය හා හේතුඵලය යි.

(2) අනුභූතිය හා තේමාව යි.

(3) විඳගන්නා දේ හා හේතුව යි.

(4) දකින දේ හා දේසළ යි.

28. විශ්ව කෝෂයක තොරතුරු සංග්‍රහ කෙරෙනුයේ මාතෘකා පාඨවල,

(1) අක්ෂර හැඩය අනුව යි. (2) නම් පිළිවෙළ අනුව යි.

(3) ඉංග්‍රීසි අක්ෂර අනුව යි. (4) ආකාරාදි පිළිවෙළ අනුව යි.

29 " කැලේ පැලට වැව් වතුරේ සුවඳ දැනේ
වෙලේ ගොයම් වැව හින්දයි සිනාසුණේ "

ඉහත නිර්මාණයෙන් ප්‍රකාශවන පරිදි ගමක ආර්ථික ශක්තිය රැඳී ඇත්තේ,

(1) වෙලේ ගොයම් නිසා ය. (2) වැව් ජලය නිසා ය.

(3) කැලය නිසා ය. (4) පැල් රැකීම නිසා ය.

30. " මම ඔවුන්ගේ තොවිලෙට ගිහිල්ල කාර් එකෙන් බැස්ස හැටියෙ ම සාරි කොටවල් දවට ගෙන හිටපු කෙල්ලො රංචුවක් විරිත්ත ගෙන මා දිහාවට දුවගෙන ආවා. එක් කෙල්ලක් මගේ බෙල්ලෙ ගැරඬියෙක් ඔතනව වගේ මල් මාලාවක් ගෙනල්ල මගේ කර උඩ අත ඇරිය"

මෙහි සඳහන් වන උපමේය හා උපමාව වන්නේ,

(1) මල්මාලාව - ගැරඬියෙක් (2) සාරි කොටවල් - මල්මාලාව

(3) බෙල්ල - ගැරඬියෙක් (4) මල්මාලාව - කර උඩ



REGISTRAR
De Mazenod College
Kandana.

31. " නිවේදකයෙක් මා ඇමතුවේ ය." යන වාක්‍යය කර්ම කාරකයට හැර වූ විට නිවැරදි පිළිතුර වන්නේ ,

(1) නිවේදකයෙකු විසින් මම අමතනු ලබමි.

(2) නිවේදකයෙකු විසින් මම අමතනු ලැබුවෙමි.

(3) නිවේදකයෙක් විසින් මා ඇමතෙයි.

(4) නිවේදකයෙකු විසින් මා අමතන ලද්දෙමි.

32. සාහිත්‍ය නිර්මාණයක් පරිශීලනයෙන් පසිඳුරන් මගින් පාඨක මනසට පිවිස පාඨකයාගේ භාව ප්‍රබෝධනයට හේතුවන වචන සංයෝජනය,

(1) අනුප්‍රාසය යි. (2) ව්‍යංග්‍යාර්ථය යි. (3) සංකල්ප රූප යි. (4) උපමා යි.

33. පහත සඳහන් වචනවලට ගැළපෙන පොදු වහර නිවැරදිව සඳහන් වන්නේ,

A - කායම - ජලය

B - දියදොස් - කුරුම්බා

C - අක්බරුව - උදැල්ල

D- සුම්බරේ - ජටාව

(1) A හා C ය. (2) B හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

● අංක 34 , 35 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

34. (1) මලින් සැරසුණු වෘක්ෂයෝ අපේ නෙත් පිනවයි.

(2) අධික වර්ෂාව නිසා එළවළු වෙළෙන්දෝ අද පැමිණ නැත.

(3) ඔවුන් පඩිපෙළ නගිද්දී සමහරු විඩාබරව සිටියහ.

(4) සිසුන් සමග පැමිණි වැඩිහිටියන් ක්‍රීඩා තරගය නැරඹූහ.

35. (1) උපදේශකවරුන් විසින් ආධුනිකයෝ පුහුණු කරනු ලැබූහ.

(2) පොත්පත් කියවීමෙන් සමහරු දැනුම දියුණු කරගනු ලැබූහ.

(3) නිවේදකයා ද නිවේදිකාව ද වේදිකාව මතට නැග්ගා ය.

(4) සරුංගල් සමූහය එක පෙළට ගුවනට යති.

36. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,

" කාලෙ හැටියට අපි වෙනස් වෙන්න ඕනෑ කියලා මම පිළිගන්නවා "

(1) කාලය අපට ගැළපෙන ලෙස වෙනස් විය යුතු බව මම පිළිගනිමි.

(2) කාලය අනුව අප වෙනස් වීමේ අවශ්‍යතාව මම පිළිගනිමි.

(3) කාලය අපව වෙනස් කළ යුතු බව මම පිළිගනිමි.

(4) කාලය අපේ හැටිය ට අපි වෙනස් කරමු.

37. A -...................... පැවැති මහ වැස්සෙන් ගෙවල් රාශියක් විනාශ විය.

B -විභාගය අසමත් ...................... නිමල් කාර්මික විද්‍යාලයේ පාඨමාලාවකට සම්බන්ධ විය.

C - දෙවියන් ......................එක ම ගැළවුම්කරු යැයි බැතිමත්හු විශ්වාස කරති.

D - රජු රාජසභා මණ්ඩපයට ...................... සම්ප්‍රාප්ත විය.

E - ඊයේ , F - වහා , G - බැවින් , H - වනාහි

● ඉහත වාක්‍යවල හිස්තැනට සුදුසු නිපාත පද අනුපිළිවෙළ වන්නේ,

(1) G , H , E , F (2) E , H , G , E (3) H , G , E , F (4) E , G , H , F

38. මුලින් දැක්වෙන වාක්‍යයේ අදහසට වඩාත් සමීප අදහස දෙන වාක්‍යය තෝරන්න.

" තිරිසන් සතුන් විනාශ වී ගියහොත් දැඩි හුදකලා බවින් මිනිසා ද විනාශ වී යනු ඇත. "

(1) මිනිස්සු තිරිසන් සතුන් විනාශ කරති.

(2) මිනිසුන් හා තිරිසන් සතුන් අතර බැඳීම ජීවිත පැවැත්මේ අවශ්‍යතාවකි.

(3) තිරිසන් සතුන් ජීවත් වන තැන මිනිස්සු ද ජීවත් වෙති.

(4) මිනිසුන් මෙන් ම තිරිසන් සතුන් ද එකට ම ජීවත් විය යුතු යි.

39. පහත සඳහන් කවියේ හතර වන කවි පාදය වන්නේ,

රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
යාන්දරට යමිනම් ඇස පියෙන්නේ
හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ
..............................................................

(1) දෙගොඩ ගොඩින් කොතන ද නුඹ සිටින්නේ

(2) එගොඩ ගොඩේ උල ලේනා හඬන්නේ

(3) හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ

(4) මෙගොඩ ගොඩේ මම සී පද කියන්නේ

40. හබලට ඔබේ සවිබල අත රිදෙනවද
ඔරුකඳ උඩින් දළ රළ පෙළ නගිනවද
සීතල සුළඟ රළුවට ඇඟ වැදෙනවද
හිමියනි වෙහෙස නිදිමත දෙක දැනෙනවද

ඉහත පද්‍ය නිර්මාණයේ රචකයා වන්නේ,

(1) ගුණදාස අමරසේකර යි. (2) සාගර පලන්සූරිය යි. (3) මොනිකා රුවන්පතිරණ යි. (4) සිරි ගුණසිංහ යි.

( ලකුණු 1 X 40 = 40 යි )

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම 2024
## සිංහල භාෂාව හා සාහිත්‍යය - 111

නම/ විභාග අංකය - ......................................................

11 ශ්‍රේණිය | iii පත්‍රය | කාලය පැය දෙක යි.

(I) උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

II) 1,2,3,4, යන ප්‍රශ්න වලටත්, 5,6,7, ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.

III) මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

(I) සිට (X) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් ප්‍රශ්නයකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

01. I) " දේවයන් වහන්ස , නොසිතා වදාළ මැනව , අනෙක් බලවත් මාගේ උපායෙක් ඇති "

අ) මෙම අවස්ථාව උපුටා ගත් පාඩම වන්නේ කුමක් ද?
ආ) මෙහි සඳහන් වන ' දේවයන් වහන්ස ' කවුරුන් ද?

II) "වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණෙ වැඩ කළා නොවේ
..........................................................................
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ"

අ) මෙම කවියේ තෙවන සදය පේළිය සම්පූර්ණ කරන්න.
ආ) මෙම ජනකවි නිර්මාණය කුමන කාව්‍ය ගණයට අයත් වේ ද?

III) " සැප සයනා සුවඳ බොජුන් - කුමුල මාලිගා
ඇ සම්පත් හැරදා ඇයි - මෙලෙස වෙසෙන්නේ "

අ) මෙම අවස්ථාව උපුටා ගත් පාඩම නම් කරන්න.
ආ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් ද?

IV) " නිරිත දිග තද සුළඟට ඇඹරවී ඇටුවත් බැහී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ. "

අ) මෙම අවස්ථාව සඳහන් නිර්මාණය කුමක් ද?
ආ) මෙහි ඇතුළත් උපමේය හා උපමාව උපුටා දක්වන්න.

V) "සතොස් කරන වීණා නද ඇසුමට
නො ගොස් සිටිනා පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹ හට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට"

අ) ඉරි ඇඳි පදයට අර්ථ සපයන්න.
ආ) මෙම සිදුවීම ඇතිවූයේ කුමක් සඳහා ද?

VI) " සතුටු ව හුණදඬු අග සිට ම කියාලා හුණදඬු අගින් අහසට නැගීලා තුදුස් විටක් විචර අහස සිසැරී පියා බැස ලා හුණදඬු අග සිටියහ."

අ) මෙම අවස්ථාව උපුටා ගත් කෘතියට ආභාසය ලබා ගත් පාලි අටුවා ග්‍රන්ථය කුමක් ද?
ආ) ඉරි ඇඳි පදයට අර්ථ සපයන්න.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

VII) " වලඳින අදහසින් මෙන් සුරගග    අගන
නල බල සසල දළ රළ පෙළ නුබ    නැගෙන"

අ) ඉහත නිර්මාණය කළ රචකයා කවුරුන් ද?
ආ) මෙහි දෙවන පෙළින් ගම්‍ය වන ශබ්දාලංකාරය කුමක් ද?

VIII) "දුරුතු මගේ දී කැලයට    වැදීලා
මසක් පමණ කල් කැලවල්    කොටලා
මැදින් දිනේ දී වල් ගිනි    තබලා
කුරහන් ඉසිමුව කළුවර    බලාලා"

අ) මෙහි දෙවන පේළියේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.
ආ) ඉරි ඇඳි පදයට අර්ථ සපයන්න.

IX) " තමන් ලැබූ දිවි පෙවෙතේ - කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ - මෙලොවට කිසි පලක් නැතේ "

අ) මෙහි නිර්මාණකරුවා නම් කරන්න.
ආ) කවියාගේ වෙනත් පද්‍ය කෘතියක් නම් කරන්න.

X) විදාගම මෛත්‍රේය හිමියන්ගේ නිර්මාණ කෘතීන් දෙකක් සඳහන් කරන්න.

( ලකුණු 2x10 = 20 යි )

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න

I) " කොල පව්වු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල, තෝ ' ධර්ම යුද්ධය ' කෙරෙමි ' යි කියා ගොසින් තට මුණුබුරු තරමටත් නැති ඉතා බාල තැනැත්තන් වැඳ පිය "

අ) මෙහි ඉරි ඇඳි පදවලට අර්ථ ලියන්න.
ආ) මෙම අවස්ථාව කෙටියෙන් හඳුන්වන්න.

II) පන් සිළු වීණා නද පසු    බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන්    තොස්වූ
නන් දන කැන් දුටුව ද බිය    සිස්වූ
මින් රළවුත් ගං වෙරළට    රැස්වූ

අ) මෙහි ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න.
ආ) කවියේ සමස්ත අර්ථය සරල බසින් ලියන්න.

III) "කිම්ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇඳහිය නොහේ ය
ඇසෙන මෙ අරුමා "

අ) මැණියන් තම දරුවන් අමතා පවසන්නට යෙදුණු කාරණය කෙටියෙන් ලියන්න.
ආ) මෙම අවස්ථාව උපුටාගත් පාඩමේ නම හා නිර්මාණයේ නම ලියන්න.

IV) කුළින් කුළම සිහිල'ඹ වැහෙන    කඳුරැය
දොළින් දොළම කල්යල් කරන    කුඹුරැය
පළින් පළම කල් පොල් ගෙවතු    මැඳුරැය
තළින් තළම පුල් පියුමු'පුල    පඬෙරැය

අ) ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න.
ආ) පද්‍යයේ තෙවන පේළියේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

V) " ශිල්පයට උපචාර කොටැ දැළි කප්වා නහා පිළිපෙරළා මවුපියන් දක්මි'යි අටවියට වදනා තැනට අවුදු මඟින් පහ වැ සිටියෙ......"

අ) ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න.
ආ) මෙම අවස්ථාව සඳහන් වන පාඩමේ නම හා උපුටා ගත් කෘතිය නම් කරන්න.

( ලකුණු 4x5 = 20 යි. )

● 3 හා 4 ප්‍රශ්න අනිවාර්යය යි. එක් ප්‍රශ්නයකට ලකුණු 15 යි.

03 ) i) දිවිමග යහපත් කර ගැනීමට උපදෙස් ලබා දීමටත්,
ii) සුදුසු කාව්‍ය උපක්‍රම යොදා ගැනීමටත්,
ජන කවියා සතු වූ ශාක්‍යතාව ' හානා හීය පානා අඬහැරෙන් දැනේ ' පැදි පෙළ ඇසුරෙන් එක් කරුණකට නිදසුන් දෙක බැගින් ගෙන විමසුමට ලක් කරන්න.

නැතහොත්

' කැරගල වෙහෙර වැනුම ' සහෘදයාට වඩාත් සමීප වර්ණනාවක් බවට පත්වූයේ,'

i) අපූරු පරිසර චමත්කාරයක් මතු කිරීමත්,
ii) ගම හා පන්සල අතර ඇති සම්බන්ධය මනා නිරූපණයක් නිසා ය.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. ( ලකුණු 15 යි. )

04 ) i) සාර්ථක සිත් ඇද බැඳ ගන්නා බස් වහරක් යොදා ගැනීමත්,
ii) අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී ගුරුළුගෝමීන් පෑ දක්ෂතාවත් අඟුල්මල් දමනය රසවත් සාහිත්‍යාංගයක් වීමට ඉවහල් වී ඇත. එකිනෙකට නිදසුන් දෙක බැගින් දක්වමින් පහදන්න.

නැතහොත්

i) ජනකවියේ ඇති අව්‍යාජත්වය,
ii) කුරක්කන් වගාවේ දී ගොවියා මුහුණ දුන් විවිධ අභියෝග ' කුරහන් ඉසිමුව කළුවර බලාලා 'යන පද්‍ය පන්තියෙන් මැනවින් නිරූපණය වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන ඉහත කරුණු පැහැදිලි කරන්න.

( ලකුණු 15 යි. )

● 5,6,7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.

5) අවස්ථා හා සිද්ධි මනා ලෙස ගැළපීම උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව කථාවේ සාර්ථකත්වයට හේතු වී ඇත. උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න.

( ලකුණු 10 යි. )

6) සැළලිහිණි සංදේශ කතුවරයා මග වැනුම්වල දී ස්වභාවෝක්තියට මූලික අවධානයක් ලබා දෙන ආකාරය උදාහරණ තුනක් මගින් විස්තර කරන්න.

( ලකුණු 10 යි. )

7) ගංගාවේ සංගීතය පද්‍ය පන්තියෙන් කවියා ඉදිරිපත් කරන ජීවන දර්ශනය උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 10 යි. )

REGISTRAR
De Mazenod College
Kandana.